# පරිසරය හා ලෝරන්ස්

අපේ ප්‍රවාද ලිපි පෙළ ලියැවෙන්නේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ නොවන දැනුමක්, මෙහි දී සිංහල බෞද්ධ සංස්කෘතිය හා චින්තනය මත පදනම් වූ දැනුමක් නිර්මාණය කරගැනීමට ය. බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ ඊනියා වර්ධනයට තව වැඩි කලක් ආයුෂ නැත. ඉන් අදහස් කරන්නේ ඒ තව අවුරුදු දහයකින් පහළොවකින් කඩා වැටෙන බව නො වෙයි. එයට තව අවුරුදු සියයක් දෙසියයක් ගතවීමට ඉඩ ඇත. ඒ දිනය නිශ්චිත වශයෙන් කිවහැකි කිසිවකු සිටින්නේ යැයි මම නො සිතමි. ඒ කඩා වැටීම කෙදිනක වුවත් අප එයට සූදානම් විය යුතු ය. අප අපේ දැනුම් නිර්මාණය කරගත යුතු යැයි අප කියන්නේ එබැවිනි. ඇතැම් විට සිංහල ජාතියේ කරපිටින් බලයට පැමිණීමට බලාපොරොත්තුවන ඇතැම් බලලෝභී දේශපාලනඥයකු අපේ අදහස් ඔහුගේ අදහස් ලෙස ප්‍රකාකරනු දැකිය හැකි ය. එහෙත් ඔහුගේ අවාසනාවකට ඔහුට කිසිදු නව ප්‍රවාදයක් සංකල්පයක් සංගත ව නිර්මාණය කරගහැනීමේ හැකියාවක් නැත. ඔහුට කළ හැක්කේ සිංහල බෞද්ධ සංස්කෘතියේ ශ්‍රේෂ්ඨත්වය ගැන දෙඩවීම පමණකි.

බටහිර ක්‍රිස්තියානි නූතනත්වය ඉදිරි කාලයේ දී කඩා වැටෙනු ඇත්තේ එයට පදනම් වූ චින්තනයෙහි ඇති දුර්වල කම් හේතුකාටගෙන ය. ඉන් සමහරක් අපි දැනටමත් සාකච්ඡා කර ඇත්තෙමු. පෞද්ගලිකත්වය ඉස්මතු කිරීම හා පුද්ගලයා අනෙක් පුද්ගලයන්ගෙන් හා සමාජයෙන් වෙන්කිරීම, ඉන්ද්‍රිය පිනවීමට හැකිතාක් ඉඩකඩ සැපයීම ආදිය මේ කරුණෙහි දී ප්‍රධාන වෙයි. බටහිර සංස්කෘතිය අද එහි කෙළවරට ඉතා අසන්න වී ඇත. අද බටහිර පෞද්ගලිකත්වය කෙතරම් වර්ධනය වී ඇත් ද කිවහොත් පුද්ගලයා අනෙක් පුද්ගලයන්ගෙන් හා සමාජයෙන් පමණක් නොව තමන්ගෙන් ද වෙන්කෙරී ඇත. මාක්ස් විද්වතා සඳහන්කළ විගලිතබව (alienation) අද ඔහු දැක්වූ ආකාරයට වඩා වෙනස් ආකාරයකින් ක්‍රියාත්මක වෙයි.

මිනිසා යනු සමාජයීය සත්වයෙකි. ඔහුට අනෙක් මිනිසුන් සමග නොයෙකුත් ආකාරයේ සම්බන්ධකම් පැවැත්වීමට අවශ්‍ය වෙයි. එය පුද්ගලයන් පුද්ගලයන් අතර ඇති සම්බන්ධයක් මෙන් ම සමස්තයක් ලෙස සමාජයේ ක්‍රියාකාරීකම් නිසා ඇතිවන සම්බන්ධකම් ලෙස ද වෙයි. පහළොස්වැනි සියවස වන තෙක් ලෝකයේ පැවති විවිධ සමාජවල, සංස්කෘතීන්හි මේ සමාජයීය සම්බන්ධකම් අඩු වැඩි වශයෙන් පවත්වාගෙන යනු ලැබිණි. එහෙත් පහළොස්වැනි සියවසේ ආරම්භ වූ බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි ඒ සම්බන්ධකම් පමණක් නොව පරිසරය හා ස්වභාව ධර්මය සමග වූ සම්බන්ධකම් ද කඩාවැටී ඇත.

මොන තරම් කතා කළත් බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට පරිසරය රැකිය නො හැකි ය. ඒ බව අප අවුරුදු ගණනාවක් මුළුල්ලෙහි කතාකර ඇත. මේ සම්බන්ධයෙන් අප ලියා ඇති ලිපි සමහරක් පරිසරය හා බටහිර ආකල්ප නමින් පොතක් වශයෙන් පළ වී ඇත. බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි " දියුණුව " ලැබීමට නම් පරිසරය විනාශ කළ යුතු ය. ඇමරිකාව පරිසරය රැකීමට මේ මොහොතේ එකඟ නොවී ඒ ගැන සාකච්ඡා කිරීම දශක කිහිපයකින් කල් දැමීමට තීරණය කර ඇත.

ඇමරිකාව පමණක් නොව ඉන්දියාව හා චීනය වැනි දියුණු වන්නේ යැයි කියන රටවලට ද පරිසරය රැකීම ප්‍රශ්නයක් වෙයි. පරිසරය රැකීමෙන්, ස්වභාවධර්මය සමග සහජීවනයෙන් කටයුතු කිරීමෙන් බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ දියුණුව ළඟා කරගත හැකි නො වෙයි. ඒ බව දන්නා ඉන්දියාව හා චීනය වැනි රටවල් පරිසර රැකීමකට එකඟකරවා ගැනීම අපහසු ය. අද ඇතැම් බටහිර රටවල නියෝජිතයෝ මෙහි සංශෝධිත ක්‍රියාමාර්ගයක් අනුගමනය කරති. ඔවුහු ඊනියා තුන්වැනි ලෝකයේ රටවලට පරිසරය රැකීමට උපදෙස් දෙති. ඒ සම්බන්ධයෙන් විවිධ රාජ්‍ය නොවන සංවිධාන ද ක්‍රියාත්මක වෙයි.

ඔවුන්ගේ අරමුණ ලෝකයේ පරිසරය රැකීම නොව ඒ තුන්වැනි ලෝකයේ යැයි කියන රටවලට බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ දියුණුව අත්කර ගැනීමට ඉඩ නො දීම ය. ඒ රටවල් බටහිර ක්‍රිස්තියානි නූතනත්ව දියුණුව අත්කර ගැනීමට ගියහොත් පරිසරය තව තවත් දූෂණය වන බව ඔවුහු දනිති. එහෙත් පරිසරය, ස්වභාව ධර්මය එක රටකට පමණක් සීමා වූ දැ නො වෙයි. ලංකාවේ පරිසරය දූෂණය වීම බටහිර රටවලට ද බලපායි. රටවල් එකිනෙකින් වෙන්

© Prof. Nalin De Silva

වී තිබුණ ද පරිසරය එසේ වෙන් වී නැත. බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට අන් සියල්ල වෙන් කළ ද පරිසරය රටින් රටට වෙන්කිරීමට නො හැකි ය.

එහි ප්‍රතිඵලය වන්නේ බටහිරයන්ට තව තවත් ඔවුන්ගේ දියුණුව ලබාගැනීමට පරිසරය දූෂණය කිරීමට ඇති "අයිතිය" ඔවුන්ට පමණක් සීමාකර ගැනීමට ය. අනෙක් රටවල් ද පරිසරය දූෂණය කිරීමට ගියහොත් සමස්ත පරිසරය දූෂණය කිරීමට බටහිරට ලැබෙන අවස්ථා අඩුවෙයි. ඒ හේතුවෙන් ඔවුන්ගේ දියුණුවට බාධා පැමිණෙයි. එබැවින් බටහිරයෝ ඊනියා තුන්වැනි ලෝකයේ රටවලට පරිසරය රැකීමට කියති. ඒ සඳහා රාජ්‍ය නොවන සංවිධාන පිහිටුවා ආධාර ද දෙති. ඒ ආධාර දෙන්නේ අවසාන වශයෙන් ගත්කල එකී රටවලට දියුණු නොවී සිටීමට ය. වෙනත් වචනවලින් කිවහොත් බටහිර රටවල දියුණුව සඳහා ඊනියා තුන්වැනි ලෝකයේ රටවල් දියුණු නොවී සිටිය යුතු ය.

එහෙත් දියුණුවන්නේ යැයි කියන ඉන්දියාව හා චීනය බටහිරයන්ගේ මේ බයිලා පිළිගැනීමට සූදානම් නැත. ආර්ථික ශක්තිය හීන වී ඇති ඇමරිකාව ද පරිසරය රැකීමට තව අවුරුදු පණහකින් කෙසේ වෙතත් අද සූදානම් නැත. මේ තත්වයන් යටතේ පරිසරය රැකීම සම්මන්ත්‍රණවලට, සාකච්ඡාවලට හා උපාධි නිබන්ධනවලට සීමා වූ මාතෘකාවක් බවට පත් වී ඇත. පරිසරය තව තවත් දූෂණය වී පුද්ගලාන්තර හා සමාජයීය සම්බන්ධකම් නැති වී පුද්ගලයා හුදකලා වී පමණක් නොව තමාගෙන් ද වෙන් වී භින්නෝන්මාදයට ගොදුරු වී බටහිර ක්‍රිස්තියානි නූතනත්ව සමාජය කඩා වැටෙන දවස කවදා දැයි කිව නොහැකි නමුත් මේ ආකාරයෙන් ම දිගට ම කටයුතු කිරීමෙන් එවැනි තත්වයකට පත්වන බව නම් පැහැදිලි ය.

ඒ තත්වයට අප මුහුණ දෙන්නේ කෙසේ ද? පළමුවෙන් ම බටහිර ක්‍රිස්තියානි නූතනත්වය යනු කුමක් දැයි හඳුනාගත යුතු ය. එහි දැනුම නිර්මාණය, එහි චින්තනය ආදිය පිළිබඳ ගැඹුරු හැදෑරීමක් කළ යුතු වෙයි. බටහිරයන් අද පවා අප පාලනය කරන්නේ කෙසේ දැයි අප වටහාගත යුතු ය. ඊනියා හරිතවාදයක් පසුපස ගොස් බටහිරයන්ගේ පරිසර රැකීමේ ව්‍යාපෘතිවල යෙදීම අපට අවශ්‍ය නො වෙයි. අපට දියුණුව පිළිබඳ අපේ ම සංකල්ප තිබිය යුතු ය. අප අපේම වූ සංවර්ධන මාවතක තමන් කළ යුතු ය. එහෙත් බොහෝ රටවල එවැනි මංමාවත් ගැන කතා නො කෙරෙයි.

ඉන්දියාව හා චීනය තම පැරණි සංස්කෘතීන් ඔස්සේ ගොස් ඒ සංවර්ධන මාර්ග පාදාගත යුතු නමුත් එහි උගතුන් එවැන්නක් කරනු දැකිය නො හැකි ය. ඉන්දියාවේ ඇතැම් උගතුන් පැරණි දැනුම් ගැන සොයා බලන බව ඇත්ත නමුත් ඔවුන් පැරණි චින්තනයක් හෝ ඔවුන්ගේ ම වූ නව චින්තනයක් හෝ මත පදනම් වී අළුත් දැනුමක් ගොඩ නැගීමට වෑයම් කරනු දක්නට නො හැකි ය. මෑතක දී ජපානයේ මාසහිකෝ ෆුජිවාරා මහතා විසින් ලියන ලද පොතක ජපානයට ආවේණික සංවර්ධනයක් ගැන කතාකර ඇතැයි කියැවෙයි. මේ පොත තවමත් ඇත්තේ ජපන් බසින් පමණක් බැවින් ඒ මාවත කුමක් දැයි පැහැදිලිව කිව නො හැකි ය. අප ඒ පොත ගැන දැනගත්තේ ඒ පිළිබඳ ඉංගිරිසියෙන් ලියැවුණු විචාරයක් කියැවීමෙනි.

අපේ ප්‍රවාද ලිපි පෙළෙන් උත්සාහ ගැනෙන්නේ සිංහල බෞද්ධ චින්තනයක නව දැනුමක් නිර්මාණය කිරීම ය. ඒ විද්‍යාවට පමණක් නොව සාහිත්‍ය විචාරයට ද සංවර්ධනයට ද අදාළ වෙයි. බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට අභියෝග කළහැකි දැනුමක් අපට නිර්මාණය කළ හැකි බව පැහැදිලි ය. එහෙත් එයින් කියැවෙන්නේ එවැනි දැනුමක් නිර්මාණය කළහැක්කේ සිංහල බෞද්ධයනට පමණක් බව නො වෙයි. අපට ඒ සඳහා වඩා ඉඩක් ඇත්තේ අප මේ කරුණ කලින් ම දුටු නිසාත් ථෙරවාද බෞද්ධ සංස්කෘතිය එයට හොඳ තෝතැන්නක් නිසාත් ය.

අද බටහිරයන්ගේ ප්‍රධාන සතුරු සංස්කෘතීන් දෙකක් වෙයි. එකක් මුස්ලිම් සංස්කෘතිය ය. අනෙක ථෙරවාද බෞද්ධ සංස්කෘතිය ය. මුස්ලිම් රටවලට යම් ආර්ථික ශක්තියක් මෙන් ම යුද්ධ ශක්තියක් ද වෙයි. බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ හා මුස්ලිම් සංස්කෘතියේ යම් සමානත්වයක් ද වෙයි. ඒ ඔවුන් බයිබලයේ පරණ තෙස්තමේන්තුවට දක්වන සම්බන්ධය අනුව ය. එසේ වුවත් වෙනත් කරුණු අතින් ඔවුහු වෙනස් වෙති. ලෝකයේ වෙනත් කිසිම සංස්කෘතියක බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි දක්නට ලැබෙන වෙන්කිරීම නැත.

© Prof. Nalin De Silva

ථෙරවාදී බෞද්ධ රටවල් දුප්පත් රටවල් වෙයි. තරමක හෝ ආර්ථික ශක්තියක් ඇත්තේ සියමට හෙවත් තායිලන්තයට ය. එසේ තිබිය දී බටහිර රටවල් තම ප්‍රධාන සතුරකු ලෙස ථෙරවාදී රටවල් දකින්නේ ඒ රටවල සංස්කෘතීන්හි ඇති ශක්තිය හේතුකොටගෙන ය. අද බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට අභියෝග කළ හැකි දැනුම් පද්ධතියක් නිර්මාණයකර විකල්ප සංවර්ධනයක් ගොඩනැගීමේ හොඳම විභවයක් ඇත්තේ ථෙරවාදී බෞද්ධ සංස්කෘතීන්ට ය. මේ විභවයට බටහිරයෝ බිය වෙති. අද බටහිරයන් මුස්ලිම් රටවල් සමග නොයෙකුත් ආරවුල් ඇතිකරගන්නා අතර ලංකාව, මියන්මාරය, තායිලන්තය, ලාඕසය හා කාම්බෝජය ද මර්දනය කිරීමට හැකි සෑම උත්සාහයක් ම දරනු දැකිය හැකි ය. බටහිරයන් දෙමළ ජාතිවාදය නිර්මාණය කර පවත්වාගෙන යන්නේ ප්‍රධාන වශයෙන් ම ඒ ඔස්තේ සිංහල බෞද්ධ සංස්කෘතිය දුර්වල කිරීමට ය.

අපි එච් ඩබ් ලෝරන්ස් මහතාගේ සාහිත්‍යය ගැන කතාකරමින් සිටියෙමු. ලෝරන්ස් විද්වතාගේ සාහිත්‍යයෙහි ප්‍රධාන අරමුණ වූයේ පෞද්ගලිකත්වය වැඩි දියුණු කිරීම ය. ඉන්ද්‍රිය පිනවීම ඔස්සේ විමුක්තිය ලබාගැනීමක් ගැන අදහසක් ඔහුට විය. ගුණදාස අමරසේකර මහතාට ද කලක දී ලෝරන්ස් විද්වතාගේ ආභාසය ලැබිණි. එහෙත් පසු කලෙක අමරසේකර මහතා ඒ ආභාසය ඔස්සේ ලියු කෘති මනස් පුතුන්ගේ සාහිත්‍යයක් ලෙස සලකා බැහැර කළ බව ගෞරවයෙන් සඳහන් කළ යුතු ය. අප ලෝරන්ස් සාහිත්‍ය ගැන කතා කරන්නේ එක් පැත්තකින් බටහිර ක්‍රිස්තියානි නූතනත්වය වර්ධනය කිරීමෙහි ලා ඉන් සිදු වූ කාර්යභාරය හැදෑරීමට ය. ලෝරන්ස් සාහිත්‍යය පෞද්ගලිකත්වය වර්ධනය කිරීමෙන් පරිසර දූෂණයට ද උපකාරී විය. ඒ අපේ සැලකිල්ලට යොමු විය යුතු අතර ලෝරන්ස් මහතා බටහිර සාහිත්‍යයට කරන ලද බලපෑම සිංහල සාහිත්‍යයට ඇතුල් නොවීම ද අපේ අවධානයට ලක්විය යුතු ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva